**තේ ශක්ති අරමුදල - 2021**

තේ ශක්ති අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2017, 2018, 2019 හා 2020 යන වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

**2.1 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම**

අරමුදලේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා ලෙජර ගිණුම්, ස්ථාවර වත්කම් ලේඛනයක්, ස්ථාවර තැන්පතු ලේඛන ඇතුළු අනෙකුත් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

අරමුදල විසින් අවසන්වරට විගණනයට ඉදිරිපත් කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් සහ වගකීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **විස්තරය** | **වටිනාකම (රු.)** |
|---|---|
| ---------- | ---------- |
| **වත්කම්** | |
| -------- | |
| ජංගම නොවන වත්කම් | 320,784,701 |
| ජංගම වත්කම් | 322,856,753 |
| **මුළු වත්කම්** | **643,641,454** |

**වගකීම්**

**-------**

| | |
|---|---|
| ස්කන්ධ ප්‍රාග්ධන | (142,264,604) |
| ජංගම නොවන වගකීම් | 461,964,905 |
| ජංගම වගකීම් | 323,941,153 |
| **මුළු වගකීම්** | **643,641,454** |

### 2.3 හිඟ ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------------- | ----------- |
| (අ) | තේ ශක්ති අරමුදල අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර අරමුදලේ ස්කන්ධ ප්‍රාග්ධනය ක්‍රමයෙන් අඩු වෙමින් පැවතුණි. ඒ අනුව 2012 වර්ෂයේ දී රු.මිලියන 124.058 ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ දී රු.මිලියන 111.65 ක ඍණ ස්කන්ධයක් බවට පත්ව තිබුණි. මෙම තත්ත්වයන් මත 2016 ජූලි 13 දිනැති අංක අමප 16/1224/726/015-I සහ 2016 අගෝස්තු 17 දිනැති අංක අමප/16/1427/726/015-II දරන අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් තේ ශක්ති අරමුදලේ කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | කර්මාන්තශාලා බදු දීම සම්බන්ධයෙන් එළඹ තිබු ගිවිසුම් ප්‍රකාරව හොරණ පොහොර ගබඩාව, මාවරලවත්ත හා කම්හල් 12 කින් 2021 දෙසැම්බර් 31 දිනට බදු මුදල් නොගෙවා ඇති ප්‍රමාණය රු.127,148,022 ක් වේ. | බදු කළමනාකරණ ගැනුම්කරුවන් වෙත අවස්ථා කිහිපයකදී අදාළ මුදල් ගෙවන ලෙස ලිඛිතව හා ආයතනය වෙත කැඳවා වාචිකව දැනුවත් කරන ලද නමුත් නොයෙකුත් හේතු ඉදිරිපත් කරමින් අදාළ මුදල් ගෙවීම පැහැර හැර ඇත. ඒ අනුව, වලහන්දුව හා මහවැලි කර්මාන්තශාලා නැවත පවරාගෙන නව බදු/කළමනාකරණ ගැනුම්කරුවන් වෙත මේ වනවිට පවරා ඇති අතර, හිඟ බදු/කළමනාකරණ ගාස්තු වෙනුවෙන් අදාල ගැනුම්කරුවන්ගේ ආරක්ෂිත තැන්පතු මුදල රඳවා ගෙන ඇත. මේ වනවිට සියලුම හිඟ මුදල් මසක් | හිඟ වාරික අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇතුළත ගෙවන ලෙසත් නැතහොත් කම්හල නැවත පවරා ගෙන හිඟ මුදල් අයකරගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භකරන බව ලිඛිතව බදු/කළමනාකරණ ගැනුම්කරුවන් දැනුවත් කොට ඇත. ඒ අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | |
| (ii) | බදු ගිවිසුම් අනුව ගෙවිය යුතු මාසික බදු කුලිය ඊළඟ මස පළමු වන දින හෝ ඊට පෙර නොගෙවීම මත ගතවන සෑම දිනකටම බදු මුදලින් සියයට 1 ක් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු බැවින්, 2021 දෙසැම්බර් 31 දිනට බදු මුදල් නොගෙවීම මත ප්‍රමාද ගාස්තු වශයෙන් රු.740,132,354 ක් අයකර ගැනීමට පවතින බව නිරීක්ෂණය විය. | ගිවිසුමේ සඳහන් 1% බැගින් දිනකට අයකරනු ලබන ප්‍රමාද ගාස්තු වටිනාකම අනුව මෙම මුදල තීරණය වී ඇති අතර, බදු/කළමනාකරණ ගැනුම්කරුවන් විසින් දිගින් දිගටම අදාළ අය කිරීම ප්‍රායෝගික නොවන බැවින්, එය ඉවත් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම් සලකා බලා තේ ශක්ති අරමුදලේ ගැටලු සම්බන්ධව යෝජනා ඉදිරිපත් කිරීමට පත්කොට ඇති කමිටුව මඟින් ඒ පිළිබඳව සමාලෝචනය කොට යෝජනා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. ඒ අනුව, ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. |
| (ආ) | බදු ගිවිසුමේ (07) වන වගන්තිය ප්‍රකාරව බදු ගැනුම්කාර පාර්ශවය විසින් සිය නිෂ්පාදන කටයුතු ආරම්භ කරන අවස්ථාවේදී එක් එක් කර්මාන්තශාලාවලට අදාළ මාසික අමු දලු ධාරිතාවයට සරිලන වටිනාකම මත රක්ෂණාවරණයක් තේ ශක්ති අරමුදල නමින් ලබාගැනීමට කටයුතු කළ යුතු වුවත්, මෙම කර්මාන්තශාලා විගණිත දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කර්මාන්තශාලාවේ වත්කම් වටිනාකමට අදාළව රක්ෂණාවරණයක් බදු/කළමනාකරණ ගැනුම්කරුවන් විසින් ලබාගෙන ඇත. අදාළ රක්ෂණාවරණයේ පිටපතක් තේ ශක්ති අරමුදල වෙත ලබාදී ඇත. | තේ ශක්ති අරමුදල නමින් රක්ෂණාවරණයක් ලබාගන්නා ලෙස බදු ගැනුම්කරුවන් දැනුවත් කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **කොත්මලේ තේ ශක්ති කම්හල** | | |
| | 2017 ජනවාරි 30 දින සිට 2027 ජනවාරි 29 දක්වා වසර 10 ක කාලසීමාවක් සඳහා තේ ශක්ති කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වය නුගේගොඩ රයිගම් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම වෙත අවබෝධතා ගිවිසුමක් මඟින් භාර දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත අඩුපාඩු | | |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය වේ. | | |
| (i) | ගිවිසුම්ගත කාලසීමාව ආරම්භ කළ දින සිට කළමනාකරණ ගාස්තු ගෙවීමට මාස දෙකක සහන කාලයක් ලබා දී තිබුණු අතර මසකට ගෙවීමට නියමිත කළමනාකරණ ගාස්තු මුදලින් ප්‍රමාද වන සෑම දිනකටම සියයට 1 ක් බැගින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට මෙම අවබෝධතා ගිවිසුම මඟින් දෙපාර්ශවය එකඟවී තිබුණි. එසේ වුවද මෙම කර්මාන්තශාලාව බදු ලෙස පවරා දුන් දින සිට 2022 ජූලි 31 දක්වා අයවිය යුතු මුළු වාරික මුදල රු.40,185,000 කින් අරමුදලට ලැබී තිබුණු මුදල රු. 4,617,000 ක් එනම් සියයට 11 ක් පමණක් විය. බදු ගැනුම්කරු අවසන් වරට 2019 ජූලි 11 දින රු. 627,000 ක බදු කුලියක් ගෙවා ඇති අතර ඉන් පසු වසර 02 ක කාලයක් තුළ කිසිදු බදු මුදලක් ගෙවා නොතිබුණි. ඒ අනුව මෙම කර්මාන්තශාලාව වෙනුවෙන් 2022 ජූලි 31 දිනට හිඟ වාරික හා හිඟ ප්‍රමාද ගාස්තු එකතුව රු. 322,718,895 ක් වී තිබුණි. | අදාළ හිඟ මුදල් 2022.10.12 දිනට ප්‍රථම ගෙවන ලෙස මේ වනවිට අවසන් වරට දින ලබා දී ඇති අතර එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් ගිවිසුම අවලංගු කොට කම්හල නැවත පවරා ගැනීමට කටයුතු කරන බවත් ගෙවිය යුතු සියලු හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරන බවත් ලිඛිතව කළමනාකරණ ගැනුම්කරු දැනුවත් කොට ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. | මාසික කළමනාකරණ ගාස්තු ඊළඟ 10 වන දින බැංකු ගත කළ යුතු අතර මාස 02 ක කළමනාකරණ ගාස්තු ගෙවීම පැහැර හරින්නේනම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |
| (ii) | මෙම කර්මාන්තශාලාවේ හොඳ තත්ත්වයේ නිමි තේ නිෂ්පාදනයක් සිදු කළ නොහැකි ආකාරයට බොහෝ යන්ත්‍ර දුර්වල තත්ත්වයට පත්ව තිබීම, උදුන් දෙකම අබලන් තත්ත්වයේ පැවතීම, ගොඩනැගිල්ල පිළිසකර කිරීම සඳහා විශාල වියදමක් දරා තිබීම හේතුවෙන් කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීමට හේතු වූ බව බදු ගත් පාර්ශවය විසින් දක්වා තිබුණි. කම්හල ආරම්භයේ සිට මේ දක්වා තේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ආරම්භයේ මාස කිහිපයක් පමණක් නිෂ්පාදන කටයුතු සිදු කර ඇති අතර ඉන් පසු මේ දක්වා කම්හල තුළ නිෂ්පාදන කටයුතු සිදු කර නොතිබුණි. එසේවුවද තේ මණ්ඩල නිලධාරින් විසින් සිදු කර ඇති පරීක්ෂණවලදී 2018 වර්ෂයේ සිට 2020 ජූලි දක්වා කම්හල වසා දමා ඇති අතර කම්හල් ගොඩනැගිල්ල හොඳ තත්ත්වයේ පැවති බව නිරීක්ෂණය කර තිබුණි. නැවත තේ පරීක්ෂකවරයා විසින් 2021 නොවැම්බර් 19 දින සිදු කර ඇති පරීක්ෂණයේදී කම්හල වසා දමා තිබුණද යන්ත්‍ර හොඳ තත්ත්වයේ පැවති බව දක්වා තිබුණි. | කම්හල අවට ඇති කම්හල් 05 තරඟකාරිත්වය මත දළු ලබාගැනීමේ පවතින අපහසුතාවය මත තේ නිෂ්පාදනය අඛන්ඩව සිදු කිරීමට නොහැකි වී ඇති බැව් දක්වා ඇත. කෙසේ වෙතත් කම්හල නිසි නඩත්තුවෙන් පවත්වාගෙන යෑම සහ නිසි කළමනාකරණය සිදු කිරීම කළමනාකරණ ගැනුම්කරුගේ වගකීම වේ. | වත්කම් ආරක්ෂා කර ගැනීමටත් භාවිතා නොකරන කම්හල් ඵලදායී ලෙස වෙනත් පාර්ශවයකට ලබා දීමටත් ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | කොත්මලේ තේ ශක්ති කම්හලේ නිෂ්පාදන ධාරිතාවය මාසිකව නිමි තේ කි.ග්‍රෑම් 38,000 ක් විය. තේ මණ්ඩලයේ තොරතුරු වලට අනුව 2019 ඔක්තෝබර් මාසයෙන් පසු 2021 පෙබරවාරි මාසයේදී පමණක් නිෂ්පාදන කටයුතු සිදු කර තිබුණු අතර කි.ග්‍රෑම් 807 ක නිමි තේ ප්‍රමාණයක් නිෂ්පාදනය කර තිබුණි. එමෙන්ම ඒ අවට පුද්ගලික කම්හල් 05 ක නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සාර්ථකව සිදු වී ඇති අතර අරමුදලට අයිති මහවැලි තේ ශක්ති කම්හලේ නිෂ්පාදන කටයුතු සැලකිය යුතු ප්‍රගතියකින් පවත්වා ගෙන යනු ලබන බව නිරීක්ෂණය විය. එමෙන්ම 2020 සැප්තැම්බර් 15 දිනැති නුවරඑළිය සහකාර තේ කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව 2020 වර්ෂයේ කම්හල් ලියාපදිංචිය අලුත් නොකර ජූලි සහ අගෝස්තු මාස තුළ නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබුණු අතරම එම මාස තුළ ලබා ගත් දලු සඳහා දලු හිමියන් වෙත රු.3,914,019 ක් ගෙවීමටද සිදුවී තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ තේ කම්හල් ලියාපදිංචිය සිදු නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තාවකාලිකව බලපත්‍රය අවලංගු කර තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ගාස්තු ගෙවා තේ නිෂ්පාදන බලපත්‍රය ලබාගැනීමේ වගකීම හා ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ අදාළ සියලු ගෙවිය යුතු වියදම් සම්බන්ධ වගකීම් කළමනාකරණ ගැනුම්කරු විසින් දැරිය යුතු බව ගිවිසුම් ප්‍රකාරව දෙපාර්ශය එකඟවී ඇත. | තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් පනවන නීති රීති රෙගුලාසි වලට යටත්ව නිෂ්පාදන කටයුතු කළ යුතුය. |
| (iv) | විදුලි බිල්පත් ගාස්තු රු. 639,803 ක මුදලක්ද බදු ගැනුම්කරු විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීම පැහැර හැර තිබුණි. | අදාළ හිඟ මුදල් ගෙවන ලෙස ලිඛිතව කළමනාකරණ ගැනුම්කරු දැනුවත් කර ඇති අතර එසේ කටයුතු නොකරන්නේ නම් ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ගිවිසුමේ කොන්දේසි කඩ කිරිම පිළිබඳව මාස 2 ක ලිඛිත දැනුම්දීමකින් පසුව බදු ගිවිසුම අවලංගු කර හිඟ විදුලි බිල්පත් බදු ගැනුම්කරුගේ තැන්පත් මුදලින් අයකර ගත යුතුය. |
| (v) | කම්හලේ නිෂ්පාදන කටයුතු සිදු නොවීමත්, බාහිර පාර්ශව වෙත ගෙවිය යුතු හිඟ මුදල් හා විශාල හිඟ කළමනාකරණ ගාස්තු ප්‍රමාණයක් පැවතීමත්, කම්හලේ ඇති වත්කම් විනාශ වී යාමත් සිදු වන බැවින් මෙම කම්හල බදු දීමේ පරමාර්ථය ඉටු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඉහත (ආ) මඟින් දක්වා ඇති පරිදි අදාළ තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අඛණ්ඩව බදු ගිවිසුමේ කොන්දේසි කඩ වේ නම් බදු ගිවිසුම ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |

**(ආ) මහවැලි තේ ශක්ති කම්හල**

මහවැලි තේ ශක්ති කම්හලේ කළමනාකරීත්වය 2019 අගෝස්තු 06 දින සිට 2029 අගෝස්තු 05 දින දක්වා වසර 10 ක කාලසීමාවක් සඳහා

මීගහතැන්න අරුණ ටී ෆැක්ටරි පුද්ගලික සමාගම වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත තොරතුරු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | මෙම කම්හලෙන් තේ වෙන්දේසිය වෙත ඉදිරිපත් කර තිබුණු තේ තොගවලින් ලබා ගත් නියැදිවල රසායනාගාර පරීක්ෂණවලට අනුව සුක්‍රෝස් මට්ටම සම්මත ප්‍රමාණය ඉක්මවා පැවති බව 2020 නොවැම්බර් 30 දින තේ කොමසාරිස් විසින් තහවුරු කර තිබුණි. ඒ අනුව කම්හලේ නිෂ්පාදන කටයුතු අත්හිටුවා තිබුණි. | එවැනි තත්ත්වයක් මේ දක්වා තේ ශක්ති අරමුදල වෙත වාර්තාවී නොමැති බැවින්, ඒ සඳහා එකඟ වීම හෝ එකඟ නොවීම පිළිබඳ ප්‍රකාශ කළ නොහැක. කෙසේ වෙතත් එම තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් විමසීම් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | තේ මණ්ඩලයෙන් විමසා පවතින ගැටලුව විසඳා ගත යුතුය. |
| (ii) | තවද 2021 ජුනි 30 දින තේ මණ්ඩල නිලධාරීන් විසින් සිදු කරන ලද කම්හල් පරීක්ෂාවේදී ඉහත දැක්වූ අඩු පාඩු සම්පූර්ණ නොකිරීමේ හේතුවෙන් කම්හලෙහි ලියාපදිංචිය 2021 ජූලි 27 දින සිට අත්හිටුවා තිබුණි. ඒ අනුව එදිනෙන් පසුව කර්මාන්තශාලාවේ තේ නිෂ්පාදනය නවතා තිබුණි. කම්හලේ පිහිටීම අනුව මාර්ග දුෂ්කරතා හේතුවෙන් දලු සැපයුම්කරුවන් කම්හල වෙත ගෙන්වා ගැනීමේ අසීරුතා, අවට ඇති කම්හල් තරඟකාරීත්වය හා ගුණත්වයෙන් අඩු කුඩා දලු ප්‍රමාණයකින් කම්හල ලාභදායී ලෙස පවත්වාගෙන යාමේ අපහසුතා හේතුවෙන් 2021 දෙසැම්බර් 15 දින සිට දලු ලබා ගැනීම නතර කර තිබුණි. පස්සර හා කැප්පෙටිපොල තේ ශක්ති කම්හල් දෙකේ කළමනාකාරීත්වය ද මෙම අරුණ තේ කම්හල් පුද්ගලික සමාගම බදු ලෙස ලබා ගෙන ඇති අතර එම කර්මාන්තශාලා දෙකෙහි හා ක්ලැරන්ඩන් තේ කර්මාන්තශාලාවේ ප්‍රතික්ෂේපිත තේ නිෂ්පාදනය කිරීමට මෙම මහවැලි කර්මාන්තශාලාව යොදා ගැනීමට අනුමැතිය ඉල්ලා තිබුණි. ඒ අනුව 2022 පෙබරවාරි 01 දිනැති නියෝජ්‍ය තේ කොමසාරිස්ගේ ලිපිය අනුව මෙම කම්හල ප්‍රතික්ෂේපිත තේ කම්හලක් ලෙස පවත්වාගෙන යාමට අවසර ලබා දී තිබුණි. | එකඟ වෙමි. | සම්මත ප්‍රමිතියෙන් යුත් දලු තේ නිෂ්පාදනයට කම්හල යොමු කළ යුතුය. |

**(ඇ) මාවරල තේ කම්හල**

2017 අප්‍රේල් 28 දින මාවරල තේ කම්හලේ කළමනාකාරීත්වය වලහන්දූව ග්‍රීන්ලයින් ෆස්ට් පුද්ගලික සමාගම වෙත වසර 10 ක කාලයක් සඳහා පවරා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත තොරතුරු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | මෙම කර්මාන්තශාලාව බදු දුන් දින සිට 2022 ජනවාරි 31 වැනි දිනට අය විය යුතු මුළු වාරික මුදල රු.23,652,000 කින් තේ ශක්ති අරමුදලට ගෙවා ඇති බදු මුදල රු. 810,000 ක් වන අතර එය මුළු මුදලින් සියයට 3.42 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදාළ හිඟ මුදල 2022.10.12 දිනට ප්‍රථම ගෙවන ලෙස අවසන් වරට දින ලබා දී ඇති අතර එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් නැවත දැනුම් දීමකින් තොරව ගිවිසුම අවලංගු කොට කම්හල නැවත පවරා ගැනීමට හා සියලු හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බැව් මේ වන විට බදු ගැනුම්කරු වෙත ලිඛිතව දැනුවත් කොට ඇත. ඒ අනුව, ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව ඇත | ගිවිසුම් ප්‍රකාරව නෛතික කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |
| (ii) | මෙම කම්හල ග්‍රීන්ලයින් ෆස්ට් සමාගම වෙත භාර දුන් දින සිට මේ දක්වා දෛනිකව තේ නිෂ්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2019 මැයි හා ජුනි මාස සඳහා මෙම තේ කම්හල වෙත තේ දලු සැපයූ දලු සැපයුම්කරුවන්ට ගෙවීමට ඇති හිඟ මුදල රු. 636,328 ක් වී තිබුණි. | එළඹ ඇති ගිවිසුම් ප්‍රකාරව ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ කම්හල සහ දලු සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල් බදු කළමනාකරණ ගැනුම්කරු විසින් ගෙවිය යුතු අතර ගිවිසුම අවලංගු කොට හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කරන අවස්ථාවේදී ඒ පිළිබඳව අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. | දලු සැපයුම්කරුවන්ගේ හිඟ මුදල් ලබාදීමට මැදිහත් විය යුතුය. |
| (iii) | වසර 03 ක් පුරා තේ නිෂ්පාදනය අසාර්ථක වීමට තේ කර්මාන්තශාලාවේ තිබූ යල් පැන ගිය යන්ත්‍ර හා නිසි ආකාරයට ක්‍රියා නොකරන දර උඳුන නිසා නිමි තේ නිෂ්පාදනයක් කර ගෙන යාමට නොහැකි වීමෙන් මාසික වාරික මුදල් ගෙවීමට අපහසු වූ බව බදුගත් පාර්ශවය විසින් දක්වා තිබුණි. එමෙන්ම බැංකු මඟින් ණය සහනාධාර ලබා ගත හැකි බව සහ විදේශ විනිමය බැංකුව හරහා ව්‍යාපාරයට ආයෝජනය කළ හැකි බව බදු ගත් පාර්ශවය බලාපොරොත්තු වුවද එම ණය ලබා ගැනීමට නොහැකිවීමෙන් මූල්‍ය අපහසුතා පැන නැඟුණ බවත් ඒ අනුව බදු මුදල් සම්බන්ධයෙන් සහනයක් අපේක්ෂා කරන බවත් දන්වා තිබුණි. | කම්හල බදු පවරන අවස්ථාවේ පැවති තත්ත්වය පරීක්ෂා කොට බලා බදු ගැනුම්කරු විසින් කම්හල සඳහා යෝජනා ඉදිරිපත් කොට ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කරමින් බදු ගැනුම්කරුවකු තෝරා ගෙන ඇති අතර බදු ගිවිසුමට එළඹීමෙන් අනතුරුව ඒ පිළිබඳව ඉදිරිපත් කරන කරුණු සම්බන්ධව සලකා බැලීමක් සිදු කළ නොහැක. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර බදු කරුගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |

**(ඈ) මාවරල වත්ත**

| | | | |
|---|---|---|---|
| (i) | වලහන්දූව ග්‍රීන් ලයින් ෆස්ට් පුද්ගලික සමාගම විසින් බදු මත ලබා ගෙන තිබුණු මෙම බදු | අදාළ හිඟ මුදල 2022.10.12 දිනට ප්‍රථම ගෙවන ලෙස අවසන් වරට දින ලබා දී | ගිවිසුම් ප්‍රකාරව නෛතික කටයුතු කර |

| | | | |
|---|---|---|---|
| | දේපළ සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 30 දිනට බදුකරු විසින් ගෙවා ඇති බදු මුදල, මුළු බදු මුදලින් සියයට 52 ක් වන අතර තේ ශක්ති අරමුදලට අයවීමට ඇති මුළු හිඟ වාරික මුදල රු. 10,300,000 ක් වී තිබුණි. | ඇති අතර එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් නැවත දැනුම් දීමකින් තොරව ගිවිසුම අවලංගු කොට වත්ත නැවත පවරා ගැනීමටත් සියලු හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බැව් මේ වන විට බදු ගැනුම්කරු වෙත ලිඛිතව දැනුවත් කොට ඇත. ඒ අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |
| (ii) | තේ ශක්ති අරමුදල සතු අක්කර 100 ක බිම් ප්‍රමාණයක් සහිත මෙම භූමියේ තේ වගාව අක්කර 42 ක් වන අතරම තේ පැළ තවානක්ද සහිත වේ. එමෙන්ම ගිවිසුමේ 19 වන වගන්තිය ප්‍රකාරව මෙම භූමියේ තේ තවාන් දෙකක් පවත්වාගෙන යා යුතු අතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනු ලබන තේ තවාන එසේම පවත්වා ගෙන යාමටත් අනික් තවාන බදු ගැනුම්කාර පාර්ශවය විසින් පවත්වාගෙන යාමටත්,පවතින මව් වගාව එලෙසම පවත්වාගෙන යාමටත් බදුකරු විසින් එකඟ වී තිබුණි. බදුකරු සමඟ එකඟ වී ඇති ගිවිසුමේ 18 වන වගන්තිය ප්‍රකාරව බදු දේපළෙහි වසරකට අක්කර 02 බැගින් අක්කර 12 ක තේ නැවත වගාව සිදු කළ යුතු අතර තේ පැළ සිටුවීමට ද බදු ගැනුම්කාර පාර්ශවය එකඟ වී තිබුණි. ඒ අනුව සමාගම විසින් අස්වැන්න ලබා ගැනීමේදී අපේක්ෂිත අස්වැන්න ලබා ගැනීමට නොහැකි වී ඇති බව 2021 අගෝස්තු 04 දිනැති තේ ශක්ති අරමුදලේ උද්ගතවී ඇති වත්කම් කළමනාකරණය සහ බදු මුදල් රැස් කිරීම පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම සඳහා නිර්දේශ ලබා දීමේ කමිටු වාර්තාවේ දක්වා තිබුණි. | ගිවිසුමේ දක්වා ඇති ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකින් බදු ගැනුම්කරු විසින් නැවත වගාවක් සිදු කර ඇති නමුත් බදු ගැනුම්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව දන්වා ඇති කරුණු සම්පූර්ණයෙන් ඉටු නොකිරීම මත අස්වැන්න පහළ ගොස් ඇති බැව් තහවුරු වී ඇත. ඒ අනුව, ඔහුගේ ඉල්ලීම මත බදු සහන ලබා දීමට එකඟ නොවන අතර ඉහත (අ) මඟින් සඳහන් කර ඇති පරිදි හිඟ මුදල් ගෙවීමට බදුකරු අපොහොසත් වන්නේ නම් අදාළ මුදල් අයකර ගැනීම සහ ඉදිරියේදී නීතිමය කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරමි. | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව තේ පැළ තවාන් හා තේ වත්ත මනාව නඩත්තු කරගෙන යන ලෙස බදුකරු දැනුවත් කළ යුතුය. |
| (iii) | 2017 අප්‍රේල් 28 දින එළඹි ගිවිසුමේ (I) වන වගන්තිය ප්‍රකාරව 2027 අප්‍රේල් 27 දක්වා වසර 05 ක කාලයකට සමාලෝචනය කිරීමට යටත්ව වසර 10 ක බදු කාලසීමාවක් ක්‍රියාත්මක වේ. එසේ වුවද, මෙම දේපළ බදු ලෙස පවරා දී වසර 4 ක් ගතවී තිබුණද මෙම වත්තේ අක්කර 100 සීමාව තුළ සීමා මායිම් නිසියාකාරව මිනුම් කර බිම් කොටස වෙන්කර දී නොතිබුණු බව 2021 මාර්තු 01 දිනැති බදුකරුගේ ලිපිය අනුව නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේදී ඉඩම මැනුම් කටයුතු සිදු කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර මේ වන විට අදාළ පිඹුරේ සහතික කරන ලද පිටපත් ආයතනය වෙත ලබා දී ඇත. ඒ අනුව, ඉදිරියේදී අදාළ ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | ඉඩම මැන දේපළ නිසියාකාරව බදුකරු වෙත භාර දිය යුතුය. |

**(ඉ)දෙනියාය තේ ශක්ති කම්හල**

වලහන්දූව ග්‍රීන් ලයින් ෆස්ට් පුද්ගලික සමාගම විසින් බදු ලෙස ලබා ගෙන තිබුණු මෙම කම්හල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත නිමි තේ ධාරිතාවය මාසිකව කි.ග්‍රෑම් 35,000 ක් වේ. එයට අදාළව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | 2016 නොවැම්බර් 17 දින සිට 2026 නොවැම්බර් 16 දින දක්වා වසර 10 කාලයක් සඳහා බදුකරු විසින් මෙම කම්හල බදු ලෙස ලබා ගෙන තිබුණු අතර 2022 අප්‍රේල් 30 දිනට මුළු බදු වලින් ගෙවා ඇති බදු මුදල සියයට 37 කි. ඒ අනුව එදිනට හිඟ බදු වාරික මුදල රු. 24,187,837 ක් වී තිබුණි. | අදාළ හිඟ මුදල 2022.10.12 දිනට ප්‍රථම ගෙවන ලෙස අවසන් වරට දින ලබා දී ඇති අතර එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් නැවත දැනුම් දීමකින් තොරව ගිවිසුම අවලංගු කොට කම්හල නැවත පවරා ගැනීමටත් සියලු හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බැව් මේ වන විට බදු ගැනුම්කරු වෙත ලිඛිතව දැනුවත් කොට ඇත. ඒ අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත | ගිවිසුම ප්‍රකාරව නෛතිකව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |
| (ii) | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තොරතුරුවලට අනුව දෙනියාය තේ ශක්ති කර්මාන්තශාලාවේ 2019 හා 2020 වර්ෂවල තේ නිෂ්පාදනය හා තේ දලු ලබා ගැනීම තේ මණ්ඩලය අනුමත කර ඇති කම්හල් මාසික නිමි ධාරිතාවය හා දලු ධාරිතාවය ඉක්මවා තිබුණු මාසද පැවති අතර දෙනියාය තේ කම්හලේ 2021 වර්ෂය සඳහාද ලියාපදිංචිය යාවත්කාලීන කර ඇත. එසේ වුවද, දෙනියාය තේ කම්හල අවට තරඟකාරී කර්මාන්තශාලා ඇති බැවින් තරඟකාරී මිල ගණන් යටතේ අමු දලු ලබා ගැනීමට සිදු වීම, යන්ත්‍ර සූත්‍ර යල්පැන ගොස් ඇති බැවින් කාර්යක්ෂමතාවය අඩු වීම හා නඩත්තු පිරිවැය අධික වීම, ඒ හේතුවෙන් නිසි ප්‍රමිතියකට නිෂ්පාදනය කිරීමට නොහැකි වීම නිසා තේ වෙළඳපොලෙහි නිසි මිලක් ලබා ගත නොහැකි වීම වැනි පිළිගත නොහැකි හේතු දක්වමින් බදුකරු විසින් මාසික බදු කුලිය නිසි පරිදි ගෙවා නොතිබුණි. | බදු ගැනුම්කරුවෙකු තෝරා ගැනීමට ටෙන්ඩර් ක්‍රමවේදය අනුව යෝජනා කැඳවීමේදී අදාළ කම්හලේ තත්ත්වය පරීක්ෂා කොට බලා ඉදිරිපත් කරන ලද යෝජනා අනුව බදු ගැනුම්කරුවෙකු තෝරා ගෙන ගිවිසුම් එළඹ ඇත. ඒ අනුව, කම්හලේ තේ නිෂ්පාදන කළමනාකරණ වගකීම බදු ගැනුම්කරු සතු වන අතර, බදු වාරික ගෙවීම් පැහැර හැරීම සඳහා ඉදිරිපත් කොට ඇති කරුණු සාධාරණ නොවන බැව් තහවුරු වී ඇති බැවින්, ඉහත (අ) සඳහා දක්වන ආකාරයට හිඟ මුදල ගෙවීම පැහැර හරින්නේ නම් ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරනු ලබයි. | නොපමාව හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |

**(ඊ) බලංගොඩ තේ ශක්ති කම්හල**

| | | | |
|---|---|---|---|
| (i) | 2017 අප්‍රේල් මස 11 වැනි දින සිට වසර 10 ක් දක්වා මෙම කම්හල බදු පදනමට ලබා දී තිබුණු අතර එහි තේ නිෂ්පාදනය පමණක් සිදු කළ යුතු විය. 2020 ජූනි 09 වන දින යහපත් නිෂ්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩල නිලධාරීන් විසින් සිදු කරන | අදාළ තත්ත්වය නිවැරදි කර ගනිමින් මේ වන විට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය පරිදි තේ නිෂ්පාදන කටයුතු ආරම්භ කොට ඇත. | ගොඩනැගිලි මනාව නඩත්තු කරමින් යහපත් නිෂ්පාදන ක්‍රමවේදවලට අනුකූලව කර්මාන්තශාලාව පවත්වාගෙන යන ලෙස |

| | | | |
|---|---|---|---|
| | ලද පරීක්ෂාවේදී යහපත් නිෂ්පාදන ක්‍රමවේද (GMP) අගය සියයට 47 ක්ව පැවතුණි. කර්මාන්තශාලාවේ ගොඩනැගිල්ලේ වහලය සහ සෙවිලි තහඩු දිරාපත් වී වැසි ජලය කාන්දු වෙමින් පැවතීම, ගොඩනැගිල්ලේ ජනෙල් කවුළු දිරාපත් වීමෙන් මැලවුම් අංශයට පක්ෂීන් පැමිණීමෙන් අපවිත්‍ර වීම, ජලය වාෂ්ප වී තේ වලට අවශෝෂණය වීමෙන් ගුණාත්මක බව පිරිහීම, මැලවුම් අංශය දිරා පත් වීම, කර්මාන්තශාලාවේ ගෙබිම පළුදු වී තිබීම නිසා බිම මත නිමි තේ ගොඩ ගසා පැවතීමෙන් වැලි හා අපද්‍රව්‍ය තේ සමඟ මිශ්‍ර වී පැවතීම, අමු තේ දලු ප්‍රවාහනයේ දුර්වලතා පිළිබඳ මෙහිදී අවධානය යොමු කර තිබුණි. එම කරුණු හේතුවෙන් කම්හලෙහි නිෂ්පාදනය 2021 ජූලි 27 වෙනිදා සිට අත්හිටුවා තිබුණි. | | බදුකරු දැනුවත් කළ යුතුය. |
| (ii) | 2021 වර්ෂය සඳහා රු.360,000 ක බදු මුදලක් තේ ශක්ති අරමුදලට අයවිය යුතුව පැවතුණි. | ඉහත (අ) සඳහන් පරිදි නිෂ්පාදන කටයුතු අත්හිටුවා තිබූ මාස 04 ක කාලපරිච්ඡේදය තුළ වාරික ගෙවීම් සිදු නොකරන නමුත් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව මේ වන විට නිසි පරිදි අදාළ වාරික ගෙවමින් පවතී.<br>අදාළ කම්හල් ගොඩනැඟිල්ල පමණක් කළමනාකරණ ගැනුම්කරු වෙත ආයතනයෙන් ලබා දී ඇති අතර, සියලු යන්ත්‍රසූත්‍ර කළමනාකරණ ගැනුම්කරු විසින් ආයෝජනය කොට ඇත. ඒ අනුව, කම්හල සඳහා විශාල මුදලක් ඔහු විසින් ආයෝජනය කර තිබීම හා නිෂ්පාදනය සිදු කරනු ලැබූ කාලය තුළ ගිවිසුම් ප්‍රකාරව නිසි පරිදි වාරික ගෙවීම වැනි කරුණු සලකා බලා අදාළ හිඟ මුදල සමාන වාරික 06 කින් ගෙවීමට සහන කාලයක් මේ වන විට කළමනාකරණ ගැනුම්කරු වෙත ලබා දී ඇත. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොපමාව හිඟ බදු අයකර ගත යුතුය. |

**(උ) ගිලීමලේ තේ ශක්ති කම්හල**

2016 නොවැම්බර් 24 දින රත්නපුර ප්‍රදේශයේ පෞද්ගලික ගැනුම්කාරියක වෙත මෙම කම්හලේ කළමනාකාරීත්වය වසර 10 ක කාලයක් සඳහා බදු පදනමට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | 2022 මාර්තු 01 දිනට තේ ශක්ති අරමුදලට අයවිය යුතු වාරික මුදල රු. 9,775,500 ක් වී තිබුණු අතර වාරික මුදල් හා හිඟ වාරික සඳහා ප්‍රමාද ගාස්තු ඇතුළුව මුළු මුදල රු.76,973,660 ක් වී තිබුණි. මෙම බදු ගැනුම්කරු විසින් 2020 ජනවාරි මස සිට 2022 මාර්තු 01 දක්වා කිසිදු මුදලක් තේ ශක්ති අරමුදල වෙත ගෙවා නොතිබුණි. | අදාළ හිඟ මුදල 2022.10.12 දිනට ප්‍රථම ගෙවන ලෙස අවසන් වරට දින ලබා දී ඇති අතර, එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් නැවත දැනුම් දීමකින් තොරව ගිවිසුම අවලංගු කොට කම්හල නැවත පවරා ගැනීමටත් සියලු හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බැව් මේ වන විට බදු ගැනුම්කරු වෙත ලිඛිතව දැනුවත් කොට ඇත. ඒ අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ බදු අයකර ගත යුතුය. |
| (ii) | කම්හලේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාමට බදු ගැනුම්කරු විසින් ඉල්ලීමක් සිදු කර තිබුණද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම කම්හලේ තේ නිෂ්පාදන කටයුතු නිසි ප්‍රමිතියෙන් සිදු නොකිරීම හා නිෂ්පාදනයේදී කෘතිම ලෙස ෆෲක්ටෝස් (Fructose) නැමැති තහනම් සීනි වර්ගය එක් කිරීම හේතුවෙන් 2021 නොවැම්බර් 30 දින සිට 2022 මාර්තු 30 දින දක්වා තේ නිෂ්පාදන බලපත්‍රය අවලංගු කර තිබුණි. එමෙන්ම මෙම කර්මාන්තශාලාව විසින් තේ වෙන්දේසියට ඉදිරිපත් කරන ලද තේ තොග, තේ මණ්ඩල රසායනාගාර පරීක්ෂාවේදී එම තේ වල පහතරට සම්මත අගය ඉක්මවා ෆෲක්ටෝස් නම් සීනි වර්ගය අඩංගු වූ බව 2022 ජුනි 27 දිනැති නියෝජ්‍ය තේ කොමසාරිස්ගේ ලිපියෙන් තහවුරු කර තිබුණි. | බදු ගැනුම්කාර පක්ෂය විසින් සිදු කරනු ලබන නිෂ්පාදන රජයේ ආයතන මඟින් පනවා ඇති නීති උල්ලංඝණය නොවන ආකාරයට සිදු කළ යුතු බව බදු ගිවිසුමේ කොන්දේසි මඟින් එකඟ වී ඇත. කෙසේ වෙතත් අදාළ කම්හලේ බදු ගැනුම්කරු විසින් ගිවිසුමේ කොන්දේසි දිගින් දිගටම උල්ලංඝනය කරන බැව් නිරීක්ෂණය වී ඇති බැවින්, (අ) මඟින් දක්වන පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලබයි. | ගිවිසුමේ 10 වන වගන්තියට පටහැනිව නීතිවිරෝධී ක්‍රියාවන් සිදුකර ඇති හෙයින් කම්හල පවරා ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (iii) | ගිලීමලේ තේ ශක්ති කම්හල විසින් 2017 සිට 2021 වසර 05 තුළ දලු සැපයුම්කරු වෙත ගෙවිය යුතු හිඟ දලු මුදල් රු. 59,234,288 ක් වී තිබුණි. | බදු ගැනුම්කාර පක්ෂය විසින් සිදු කරනු ලබන නිෂ්පාදන රජයේ ආයතන මඟින් පනවා ඇති නීති උල්ලංඝණය නොවන ආකාරයට සිදු කළ යුතු බව බදු ගිවිසුමේ කොන්දේසි මඟින් එකඟ වී ඇත. කෙසේ වෙතත් අදාළ කම්හලේ බදු ගැනුම්කරු විසින් ගිවිසුමේ කොන්දේසි දිගින් දිගටම උල්ලංඝනය කරන බැව් නිරීක්ෂණය වී ඇති බැවින්, (අ) මඟින් දක්වන පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලබයි. | දලු සැපයුම්කරුවන්ගේ හිඟ මුදල් ලබාදීමට මැදිහත් විය යුතුය. |
| (iv) | 2022 පෙබරවාරි 28 දින මෙම කම්හල් භාණ්ඩ සම්බන්ධව රත්නපුර ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි හා තේ ශක්ති අරමුදලේ කළමනාකාර සහකාරවරුන් දෙදෙනෙකු විසින් සිදු කරන ලද පරීක්ෂණයේදී, බදු ගැනුම්කරුගේ ඉල්ලීම පරිදි කැප්පෙටිපොල කම්හලෙන් ලබා දී තිබුණු වියළීමේ යන්ත්‍රය (Drier) කම්හලෙන් පිටත | අදාළ යන්ත්‍රය ස්ථාපනය කරන ලෙස බදු ගැනුම්කරු මේ වන විටත් දැනුවත් කොට ඇත. | වත්කම් ආරක්ෂා කර ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගලවා දමා තිබීම හා කම්හල් භූමිය නිසිපරිදි නඩත්තු නොකිරීමත්, අදාළ ඉඩමේ මායිම් සම්බන්ධ ගැටලු පැන නැගී තිබීමත් හේතුවෙන් තේ ශක්ති අරමුදලේ ස්ථාවර වත්කම් නිසි පරිදි නඩත්තු හා ආරක්ෂා නොවීමත් නිරීක්ෂණය කර තිබුණි. | | |

**(ඌ) ඇල්පිටිය තේ ශක්ති කම්හල**

| | | | |
|---|---|---|---|
| (i) | 2021 මාර්තු 22 දිනැති බදුරලිය සහකාර තේ කොමසාරිස්ගේ අභ්‍යන්තර මැමය අනුව මෙම කම්හල 2019 වර්ෂයේ සිටම අනුමත නොකළ, බලපත්‍ර රහිත වෙළඳුන්ගෙන් දලු භාරගන්නා බවත් එය තේ කොමසාරිස්ගේ චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝණය කිරීමක් වන හෙයින් රු.10,000 දඩ මුදලකට යටත් කොට තිබුණි. තේ ශක්ති අරමුදල මේ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කළ යුතු බවද නිරීක්ෂණය විය. | අදාළ තත්ත්වය මේ දක්වා තේ ශක්ති අරමුදල වෙත වාර්තා වී නොමැති අතර, එවැනි තත්ත්වයක් මඟහැර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බැව් දන්වා සිටිමි. කෙසේ වෙතත් තේ නිෂ්පාදනය පිළිබඳව රජයේ ආයතනය මඟින් පනවා ඇති නීති රීති උල්ලංඝනය නොවන ආකාරයට සිදු කළයුතු බව බදු ගැනුම්කාර පාර්ශවය එකඟ වී ඇත. | අනුමත නොකළ සැපයුම්කරුවන්ගෙන් දලු මිලදී නොගත යුතු බව බදුකරු දැනුවත් කළ යුතුය. |
| (ii) | 2022 මැයි 31 දින වන විට තේ ශක්ති අරමුදලට අයවිය යුතු හිඟ කළමනාකරණ ගාස්තු රු.2,150,000 ක් වී තිබුණු බව නිරීක්ෂණය කෙරේ. | අදාළ හිඟ මුදල 2022.10.12 දිනට පෙර ගෙවන ලෙස අවසන් වරට දින ලබා දී ඇති අතර, එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වන්නේ නම් ඉදිරියේ අවශ්‍ය නීතිමය පියවර ගන්නා බැව් ලිඛිතව කළමනාකරණ ගැනුම්කරු දැනුවත් කොට ඇත. | නොපමාව හිඟ බදු මුදල් අය කර ගත යුතුය. |

**(එ) රයිගම් කෝරලේ තේ ශක්ති කම්හල**

| | | | |
|---|---|---|---|
| | රයිගම් කෝරලේ තේ ශක්ති කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වය 2016 ජුනි 10 දින සිට 2021 ජුනි 10 දක්වා වසර 5 කට දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත භාර දී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මෙම කම්හල තේ ශක්ති අරමුදල විසින් ක්‍රියාත්මක වූ කාලය තුළ බාහිර පාර්ශව වෙත ගෙවීමට තිබුණු රු.5,593,360 ක මුදල එම දලු හිමියන් වෙත ගෙවීමට හා රු. 250,000 මාසික බදු මුදලක් තේ ශක්ති අරමුදලට ගෙවීමටද එකඟ වී දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය විසින් මෙම කම්හලේ කළමනාකාරීත්වය බදු පදනමට ලබා ගෙන තිබුණද එම ගිවිසුමට පටහැනිව 2018 මැයි 11 දින දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය විසින් එපින් ෆොරස්ට් ආර්.ටී.එස් ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම සමඟ නව ඒකාබද්ධ ගිවිසුමක් ඇති කරගෙන ඒ අනුව 2018 | තේ ශක්ති අරමුදල කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික අභිවෘද්ධිය උදෙසා ආරම්භ කොට ඇති ආයතනයක් බැවින්, කුඩා තේ වතු හිමියන්ගේ සාමාජිකත්වයෙන් ගොඩ නඟා ඇති දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය අදාළ කම්හල කළමනාකරණය සඳහා වැඩි අවස්ථාවක් ලබා දී ඇත. කෙසේ වෙතත් දිගින් දිගටම කම්හලේ කළමනාකරණ අසාර්ථක වීම හා බදු වාරික නොගෙවීම මත කම්හල නැවත පවරා ගෙන මේ වන විට රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත ලබා දී | දලු සැපයුම්කරුවන්ගේ හිඟ මුදල් ලබාදීමට මැදිහත් විය යුතුය. ගිවිසුම් ප්‍රකාරව නෛතිකව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය.<br><br>දලු සැපයුම්කරුවන්ගේ හිඟ මුදල් ලබාදීමට |

| | | | |
|---|---|---|---|
| | ඔක්තෝබර් 05 දින කම්හලේ තේ නිෂ්පාදනය ආරම්භ කර මාස 6 ක් පමණක් නිෂ්පාදන කටයුතු සිදු කර තිබුණි. | ඇත. | මැදිහත් විය යුතුය. ගිවිසුම් ප්‍රකාරව නෛතිකව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |
| (ii) | නියෝජ්‍ය තේ කොමසාරිස්ගේ තොරතුරු අනුව දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙතින් මෙම කම්හල නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගන්නා විට දලු හිමියන් වෙත තේ දලු සඳහා රු.24,259,520 ක මුදලක් අයවීමට තිබුණි. එමෙන්ම 2021 දෙසැම්බර් 31 දිනට රු.8,156,640 ක බදු මුදලක්ද දික්හේන කුඩා තේ වතු සමිතියෙන්,තේ ශක්ති අරමුදලට අයවිය යුතුව තිබුණි. කම්හලේ විදුලිය විසන්ධි කර තිබුණු අතරම කර්මාන්තශාලාවේ මෝටර් රථ හා යන්ත්‍ර සූත්‍ර කම්හල තුළ නොතිබුණු බවද හඳුනා ගෙන තිබුණි.දික්හේන කුඩා තේ වතු සමිතිය, තේ ශක්ති අරමුදල සමඟ එකඟ වූ ගිවිසුම මේ ආකාරයෙන් කඩකර තිබුණද තේ ශක්ති අරමුදලට අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීමට ඵලදායි පියවරක් ගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | දික්හේන කුඩා තේ වතු සංවර්ධනය සමිතිය මඟින් කම්හල නැවත පවරා ගන්නා තුරු ගිවිසුම් ප්‍රකාරව බදු ලබා ගෙන පැවති එම සමිතිය සමඟ තේ ශක්ති අරමුදල කටයුතු කොට ඇති අතර, හිඟ මුදල් අයකර ගැනීමට එම සමිතිය එකඟතාව පළ කොට ඇත. ඒ අනුව, ගිවිසුම් ප්‍රකාරව කිසිදු අවස්ථාවක වෙනත් තෙවන බදුකරුවෙකු සමඟ තේ ශක්ති අරමුදල කටයුතු සිදු කර නොමැත. | |
| (iii) | නැවත 2021 ජනවාරි 20 දින සිට 2031 ජනවාරි 19 දක්වා වසර 10 ක කාලයකට, රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය විසින් රයිගම් කෝරලේ තේ කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වය බදු පදනමට ලබා ගැනීමට අවබෝධතා ගිවිසුමකට එකඟ වී තිබුණි. බදු ගිවිසුමට අනුව මසකට රු.600,000 බැගින් කළමනාකරණ ගාස්තු ගෙවීමටත්, දික්හේන සමිතියෙන්, තේ දලු සැපයූ පාර්ශවවෙත ගෙවිය යුතු රු.23,302,826 ක මුදල එම පාර්ශව වෙත ගෙවීමටත් රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය එකඟ වී තිබුණ ද 2021 දෙසැම්බර් 31 දිනට මෙම සමිතියෙන් තේ ශක්ති අරමුදලට අයවිය යුතු බදු මුදල රු. 3,600,000 ක්වී තිබුණු අතර ඉහත හිඟ තේ දලු මුදල්ද ගෙවා නොතිබුණි. | මේ වන විට ගෙවිය යුතු හිඟ මුදල් 2022.10.12 දිනට ප්‍රථම ගෙවන ලෙස අවසන් වරට දින ලබා දී ඇති අතර, එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් නැවත දැනුම් දීමකින් තොරව ගිවිසුම අවලංගු කොට කම්හල නැවත පවරා ගැනීමටත් සියලු හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බැව් මේ වන විට බදු ගැනුම්කරු වෙත ලිඛිතව දැනුවත් කොට ඇත. ඒ අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත | ගිවිසුම් ප්‍රකාරව නෛතිකව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තේ ශක්ති ඉඩම මායිම් නිවැරදිව හඳුනාගෙන මිනුම් කර නොමැති අතර එම ඉඩම් අනවසර පදිංචිකරුවන් භුක්ති විඳීමෙන් ඒවා නිරවුල් කර ගැනීමට නීතිමය පියවර ගැනීමට සිදු වීම | තේ ශක්ති අරමුදලට අයත් බාහිර පාර්ශවයන් බුක්ති විඳින ඉඩම් කොටස් නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය නඩු පවරා ඇති අතර අනෙකුත් ඉඩම්වල මායිම් නිරවුල් කිරීමේ | නඩු නිමිති අවම වන පරිදි කළමනාකරණ කටයුතු සිදුකළ |

| | | | |
|---|---|---|---|
| | නිසා එය අරමුදලට අමතර වැය බරක් වීම. | අරමුණින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහය ඇතිව නැවත මැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | යුතුය. |
| (ආ) | මහවැලි තේ ශක්ති තේ කම්හලට අයත් ඉඩමේ කොටසක් පුද්ගලයකු විසින් අනවසරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් හා බලංගොඩ තේ ශක්ති තේ කම්හලට අයත් පර්චස් 5.41 ක ඉඩම් ප්‍රමාණයක පුද්ගලයකු විසින් ගරාජයක් ඉදිකිරීම නිසා ඒ අයට එරෙහිව අරමුදල විසින් නඩු දෙකක් පවරා තිබුණි. | එකඟවෙමි. | නඩු කටයුතු කඩිනමින් අවසන් කර ගත යුතුය. |
| (ඇ) | තේ ශක්ති අරමුදල විසින් ආරම්භ කරන ලද අක්‍රීය කම්හල් සක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපරිම සීමාව රු. ලක්ෂ 07 කට යටත්ව ණය මුදලක් සපයා තිබුණු අතර අදාළ ගිවිසුම් කාලය අවසන් වූ පසුව තේ ශක්ති අරමුදලට අයවීමට තිබුණු මුදල් අයකර ගැනීමට තේ කම්හල් 05 කට එරෙහිව නඩු පවරා තිබුණි. | අදාල ව්‍යාපෘතිය යටතේ හිඟ ණය මුදල් පැවති සියලු කළමනාකරණ කම්හල් වෙත නඩු පවරා ඇති අතර ඇතැම් කර්මාන්තශාලා වෙනුවෙන් ලබා දී ඇති ණය මුදල් නඩු තීන්දු මඟින් මේ වනවිට අයකර ගැනීමටද කටයුතු කොට ඇත. | නඩු නිමිති අවම වන පරිදි කළමනාකරණ කටයුතු සිදුකළ යුතුය. |
| (ඈ) | කර්මාන්තශාලා බදු දීමෙන් ලැබෙන ආදායමෙන් කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීමට හා සුබසාධන රක්ෂණ අරමුදලෙන් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රු.මිලියන 135 ක මුදල් නැවත එම අරමුදල වෙත ලබා දීමට කටයුතු කිරීම සහ ඉන් අනතුරුව ඉතිරිවන බදුකුලී ආදායම ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීම තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරිමේ අපේක්ෂාව විය. එසේ වුවද අපේක්ෂිත අයුරින් කර්මාන්තශාලා බදුකුලී ආදායම් ලබාගැනීමට අපොහොසත්වීම නිසා අරමුදල ප්‍රතිව්‍යුහගත කර වසර 5 ක් පමණ ගත වුවද උක්ත අරමුණු කරා ලඟාවීමට අරමුදලට නොහැකි වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ කළමනාකාරිත්වය සහ වත්කම් බදු දීමෙන් රු. 165,806,868 ක බදුකුලී ආදායමක් ලබා තිබුණද, සුභසාධන රක්ෂණ අරමුදලින් කර්මාන්තශාලා කටයුතු සඳහා ලබා දුන් රු. මිලියන 135 ක මුදලින් සුබසාධන රක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | මේ වනවිට සුභසාධන රක්ෂණ අරමුදලේ මිලියන 135 ක වටිනාකමට අදාළව මුදල් තේ ශක්ති අරමුදල නමින් ස්ථාවර තැන්පතු ගිණුම්වල මුදල් ආයෝජනය කර ඇත. අදාළ අරමුදල මඟින් තේ ශක්ති සාමාජිකයන්ගේ සමූහ ජීවිත රක්ෂණය පවත්වා ගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන වෙනුවෙන් පමණක් එම අරමුදලේ මුදල් භාවිතා කරනු ලබයි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට අනුමැතිය ලබාදෙන ලද 2016 ජුලි 13 දිනැති අංක අමප/16/1224/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි ස්ථිර කාර්යය මණ්ඩලය අමාත්‍යාංශය යටතේ පවත්නා වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමේදී අදාළ ආයතනයේ කැමැත්ත මත සහ කාර්යය මණ්ඩල වැටුප් හා වේතන එකී ආයතනවල පවත්නා අයවැය ප්‍රතිපාදන මත ගෙවීමට කටයුතු කළ යුතුය.<br>එසේ වුවද කළමනාකරණ සහකාර නිලධාරින් තිදෙනෙක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ද, රියදුරකු කුඩා තේ වතු සංවර්ධන අධිකාරියටද, මුදාහැර තිබුණු අතර 2018 සහ 2019 වර්ෂයන් හි එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් ලෙස රු.1,459,614 ක් හා රු.1,822,298 ක් අරමුදලෙන් ගෙවීම් කර තිබුණි. එමෙන්ම කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු හා රියදුරකු වෙනුවෙන් 2020 වර්ෂයේදී රු.1,587,324 ක් හා 2021 වර්ෂයේදී රු.1,715,940 ක්ද ගෙවා තිබුණි. | අදාළ ආයතනවල පැවති පුරප්පාඩු මත අදාළ අනුයුක්ත කිරීම් සිදු කර ඇති අතර, ඒ පිළිබඳව ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට ආරම්භ කොට ඇත. | බාහිර ආයතනයකට මුදාහළ නිලධාරීන්ට ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කරගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තේ ශක්ති අරමුදලට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් නඩුවක් හා කම්කරු විනිශ්චය සභාවල නඩු 33 ක් පවරා තිබුණි. | එකඟවෙමි. | කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කිරීමේදී චක්‍රලේඛ හා අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |